# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120

ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO – 182/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2024

දිනය / திகதி / Date – 31/01/2024 පැය 1215

## මාධ්‍ය නිවේදනය

.

**<u>පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු</u>**

**01. 2024.01.30 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරින් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| **04** | **04** | **82** | **1251** | තඹ දඟර **02**<br>යකඩ බැරල් **09**<br>බූලි **01** |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථාන වෙත ඉදිරිපත් කර ඇත.

**02. රජයේ ඉඩමක් අනවසරයෙන් එළි කරමින් සිටි සැකකරුවන් 04 දෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා පුල්මුඩේ කඳවුර.**

2024.01.30 වන දින සවස් කාලයේදී පුල්මුඩේ පොලිස් වසමේ පාලම්කුලම් ප්‍රදේශයේ දී පොලිස් විශේෂ කාර්ය බලකා පුල්මුඩේ කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **රජයේ ඉඩමකට අනවසරයෙන් ඇතුළු වී එස්කැවේටර් යන්ත්‍රයක් උපයෝගී කර ගනිමින් එළි පෙහෙළි කරමින් සිටි සැකකරුවන් 04 දෙනෙකු එස්කැවේටර් යන්ත්‍රයද** සමඟ අත්අඩංගුවට ගෙන පුල්මුඩේ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත්සැකකරුවන් අවුරුදු 35, 63 හා 74 වයස්වල පසුවන පුල්මුඩේ සහ ගෝමරන්කඩවල ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.** පුල්මුඩේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

## 03. ගංජා හේනක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා උඩවලව කඳවුර.

2024.01.30 වන දින සවස් කාලයේ හම්බේගමුව පොලිස් වසමේ අළුත්වැව ප්‍රදේශයේ දී පොලිස් විශේෂ කාර්ය බලකා උඩවලව කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර නීති විරෝධීව වගා කරන ලද ගංජා ගස් 6226 ක හේනක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන හම්බේගමුව පොලිස් ස්ථානයට භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 44 ක් වූ වීරවිල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** හම්බේගමුව පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**